**තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2023**

--------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.35,913,476ක් වූ වත්කම් හා රු.5,773,355 ක් වූ වගකීම් අඩුවෙන් දැක්වීම් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.45,464,689ක් වූ අතිරික්තය අඩුවෙන් දැක්වීමට අදාලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව වැරදි නිවැරදි කර පෙර වර්ෂයට අදාල සංසන්දනාත්මක අගයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වසරට අදාළ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී සන්සන්දනාත්මක අගයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09හි 47 වන ඡේදය ප්‍රකාරව, කොමිෂන් සභාවේ රු.13,898,485 ක ඉතිරි තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල—හෙළිදරව් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.1,312,200ක් වූ උඩුකබා ඉතිරි තොගය ගිණුම්ගත කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ආරම්භක හා අවසාන තොගයේ අගය ගිණුම්ගත කිරීමට අදාල සටහන් 2024 වසරේදී යෙදීමට කටයුතු කරන අතර 2023 වසරට අදාල අගයන් සංසන්දනාත්මක අගයන් තුලින් නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | සියලුම තොග ගිණුම් ගත කළ යුතු අතර තොග මැනීමේදී යෙදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ඇ) | ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබූ රු.7,800,000ක මුදලින් ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වැයකර තිබූ රු.1,422,096ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විලම්භිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | භාණ්ඩාගාරයෙන් ලද මුළු ප්‍රාග්ධන ප්‍රදාන අගයෙන් ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා යෙදවූ අගය අඩු කරමින් වර්ෂයේ අතිරික්තය ගණනය කරන බැවින් එහි ඉතිරිය පමණක් කාර්යයසාධන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස |

| | |
|---|---|
| ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස පෙන්වන ලද බව. | හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ආදායම් කාණ්ඩ 04 ක් සම්බන්ධයෙන් අදාල අංශයන්ගෙන් ලබාගත් තොරතුරු අනුව ආදායමෙහි එකතුව රු.10,151,500 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු.8,812,710 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායමේ රු.1,338,790 ක නොසැසඳීමක් පැවතුණි. | ආදායම් කාණ්ඩ 04 හි වෙනස්වීම්වලට හේතුව පරීක්ෂාකර බලා වාර්තා කිරීමට කටයුතු කරන බව. | එකතු කරනු ලබන ආදායම් සම්බන්ධයෙන් නිවැරදි වර්තා තබා ගැනීමටත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට පෙර අදාල අංශ මඟින් එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | බාහිර ආයතන 04 ක් සඳහා සහතිකපත් නිකුත් කිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව වෙත ලැබිය යුතු රු.11,090,000 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වහාම පරීක්ෂා කර බලා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ලැබියයුතු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ශේෂය වූ රු.14,479,985 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අගයන් පිළිබඳ හෙළිදරව් වී නොතිබුණු බව. | බාහිර ආයතන සඳහා ගෙවිය යුතු මුදල් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තහවුරු කිරීම් ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු ශේෂය | 40,363,399 | 9,699,000 | 30,664,399 | අදාල ආයතන දැනුවත් කර මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ආදායම් හඳුනා ගෙන ගිණුම්ගත කළ |

| | |
|---|---|
| කරන බව. | යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| NVQ වැඩසටහන් වියදම් යටතේ විභාග ගාස්තු | 24,322,926 | වියදම් වර්ගීකරණයක් හා 2023 වර්ෂයේදී මුද්‍රණය කරන ලද විභාග ප්‍රශ්න පත්‍ර හා අනෙකුත් මුද්‍රිත ද්‍රව්‍ය සහ ඒවා සඳහා ගෙවන ලද වටිනාකම් පිළිබඳ තොරතුරු | ජාතික වෘත්තීය සුදුසුකම් විභාග වියදම එක් වියදම් ශීර්ෂයක වුවත් ඉදිරි වර්ෂයේ දී මෙම වියදම තවදුරටත් විස්තරාත්මකව එම වියදමේ අනු උපසටහනක් ලෙස අවසාන ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අදාළ වියදම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි සවිස්තරාත්මකව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 156(i)(ආ) හා 322(1) රෙගුලාසි | සරප්වරුන්, අයකැමිවරුන් ඔවුන්ගේ ලිපිලේඛන වාර්තා යාවත්කාලීනව පවත්වාගත යුතු වුවත් කොමිෂන් සභාවේ යම් අවස්ථාවක ඔවුන් සතුව | විගණනයෙන් පෙන්වාදුන් පරිදි මෙම අඩුපාඩුව මගහරවා ගැනිම සඳහා යම්කිසි අවස්ථාවකදි අතැති මුදල් අගය නිවැරදිව බලාගනු පිණිස පැකේජයේ තෝරාගතයුතු විකල්පය | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොත්පත්,ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇති මුදල් වටිනාකම නිශ්චිතව ප්‍රකාශ කල හැකි වන ආකාරයට මුදල් පොත යාවත්කාලීන කර නොතිබුණි. | පිළිබඳ උපදෙස් ලබාගෙන රිසිට් පත් නිකුත් කිරිමට පියවර ගෙන ඇති බව. | |
| ii. | මුදල් රෙගුලාසි 319 (1) සහ 321 රෙගුලාසි | සේප්පුවල අනු යතුරු මුද්‍රා තබා කවරවල බහා ආරක්ෂිතව තැබිය යුතු වුවත්, සේප්පුවේ යතුරු කට්ටල දෙකම විගණන පරීක්ෂාව සිදුකරන අවස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) භාරයේ තිබුණි. | සේප්පුවේ යතුරු කට්ටලය නිළධාරින් දෙදෙනෙකු භාරයේ තැබීමට පියවර ගෙන ඇති අතර එම නිසා එක් නිළධාරියෙකුට පමණක් සේප්පුව විවෘත කළ නොහැකි බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සේප්පුවෙහි ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කල යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 323 රෙගුලාසිය | 2024 ජූලි 15 දින විගණන නිලධාරීන් විසින් සිදු කරන ලද භෞතික මුදල් පරීක්ෂාවේදී රු.345,651ක මුදල් ඌනතාවයක් පැවතුණි. | විගණනයෙන් දි ඇති උපදෙස් පරිදි මුලික පරීක්ෂණයක් සිදු කිරිම සඳහා අභ්‍යන්තර විගණන අංශය වෙත භාරදි ඇති අතර එම අංශයෙන් ලබා දෙන නිර්දේශමත ඉදිරි පියවර ගැනිමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| iv. | මුදල් රෙගුලාසි 325 රෙගුලාසිය | සියළුම මුදල් පිලිබඳව යටත් පිරිසෙයින් මසකට වරක්වත් සම්පූර්ණ ක්ෂණික හරි වැරදි බැලීමක් සිදුකල යුතු වුවත් විගණන පරීක්ෂාවට භාජනය කරන ලද 2023 හා 2024 වර්ෂ තුලදී එක් වතාවක් හෝ පරීක්ෂා කර නොතිබුණි. | විගණනය විසින් හා විගණන හා කළමණාකරන කමිටුව දුන් උපදෙස් පරිදි මෙම කාර්යය ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පවරා ඇති බව. | මුදල් අවභාවිතාවන් වළක්වා ගැනීම සඳහා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| v. | මුදල් රෙගුලාසි 395(ආ)(ඉ) | මුදල් අයකැමි වෙත දෛනිකව රැස්වන මුදල් බැංකුගත කර නොතිබූ අතර අතැති මුදල් සෑම මාසයක් අවසානයේදීම බැංකු සැසඳුම් ප්‍රකාශයේ උපලබ්ධි නොවූ තැන්පත් ලෙස දක්වා තිබුණි. | ගිණුම් පද්ධතිය අනුව කොමිෂන් සභාව වෙත ලැබෙන සියළුම මුදල් සඳහා රිසිට්පත් නිකුත් කරනුයේ බැංකු ගිණුම් මඟිනි. ඒ අනුව 2023 දෙසැම්බර් 30,31 දින සති අන්ත දින වන බැවින් බැංකුවේ තැන්පත් නොකළද ඍජුව බැංකු ගිණුම් හරහා රිසිට්පත් නිකුත්කරන බව. | බැංකු සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 (i) ඡේදය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව පාලක මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුලදී දීමනා වර්ග 16 ක් වෙනුවෙන් එකතුව රු.38,351,005 ක් කොමිෂන් සභාවේ නිළධාරීන් හා එම කාර්යයන් සඳහා ලියාපදිංචි බාහිර පුද්ගලයන් වෙත ගෙවා තිබුණි. | බාහිර හා අභ්‍යන්තර නිලධාරීන් වෙත කරනු ලැබූ දීමනා සඳහා අදාල කර ගනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛ පිළිබඳ විස්තරය මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා බව. | අමතර දීමනා ලබා ගැනීමේදි චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| 2016 පෙබරවාරි 26 දිනැති අංක MSDVT/SSDP/2016-1 දරන නිපුණතා අමාත්‍යංශ ලේකම්ගේ චක්‍රලේඛය | NVQ 1 සිට 6 දක්වා පාඨමාලා පවත්වන සියලුම ආයතන විසින් 2017 වර්ෂයේ සිට තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම අනිවාර්ය වුවද 2019 වර්ෂයෙන් පසු කිසිදු ආයතනයක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. නියාමන ආයතනය ලෙස කටයුතු කරන කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමර්ගයක් ගෙන නොතිබුණි. | 2024.05.13 දින සිට තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමේ කාර්යය සඳහා වෙනම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු පත් කරන ලද අතර පළමු වැඩසටහන 2024.7.25 දිනට යොදා ඇති බව. | NVQ පාඨමාලාවල ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම කෙරෙහි නියාමන ආයතනය ලෙස වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,065,996 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.23,722,454 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 12,656,458 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමසඳහා වැඩසටහන් වියදම් (NVQ) හා ක්ෂය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1990 අංක 20 දරන තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2 පරිච්ඡේදයහි 11 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව පිහිටුවා වසර 32 ක් ගත වී තිබුණද මෙම ආයතනය ස්ථාපනය කිරීමේ මූලික අරමුණු වලින් එකක් වූ ජාතික වෘත්තීය අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කර ගැසට් පත්‍රයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය 2023 වර්ෂය අවසන් වනවිටත් ඉටු කර ගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවතින බව. | ආයතනය ස්ථාපනය කිරීමේ මූලික අරමුණු ඉටුකරගැනීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය හා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් කොමිෂන් සභාවේ අනුමත ක්‍රමවේදයෙන් බැහැරව සිසුන් ලියාපදිංචි කිරීම, පාඨමාලා ලියාපදිංචි කිරීම, ජාතික නිපුණතා සහතික (NVQ) නිකුත් කිරීම ආදී කටයුතුවල නිරත වීම් සිදු කරන ලද බව අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 10(3)(අ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවෙන් නිසි පරිදි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි. | EBT ක්‍රමවේදය යටතේ පාඨමාලාවලට සිසුන් බඳවා ගත් පසු සියළුම සිසුන්ගේ තොරතුරු, තොරතුරු පද්ධතියට ඇතුළත් කරන ලෙස NAITA ආයතනය දැනුවත් ඇති නමුත් NAITA ආයතනය මඟින් අදාළ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර නොමැති බව. | කොමිෂන් සභාව මඟින් නියාමනය වන රාජ්‍ය ආයතන වල ක්‍රියාකාරීත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | විදුලි සංදේශන කාර්මික සහතිකපත් (Certificate for Telecommunication Technician ) පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම සඳහා ප්‍රතීතනය ලබාගැනීමට අවශ්‍ය පරිසාධක සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් ප්‍රතීතනය ලබා දී නොතිබුණි. එහෙත් එම පාඨමාලාව අවසන්වී වසරකට අධික කාලයක් ගතවීමෙන් පසු පරිසාධක මට්ටම් ලබා වී ඇති බව තහවුරු කර ප්‍රතීතනය ලබා දී තිබීමෙන් පාඨමාලා ප්‍රතීතනය කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | මේ වන විට NAITA ආයතනය පාඨමාලාව නිසි පරිසාධක මට්ටමට ලඟා කරගෙන ප්‍රතීතනය ලබාගෙන ඇති අතර, මෙම පාඨමාලාවේ මේවන විට පුහුණුව අවසන් කර ඇති කණ්ඩායම් 03 ක් සඳහා ප්‍රතීතනය ලබාගැනීමෙන් පසු විභාග පවත්වා සහතික නිකුත් කිරීමේ කටයුතුද සිදුකර ඇති බව. | පාඨමාලා පවත්වනු ලබන ආයතන විසින් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම සඳහා ප්‍රතීතනය ලබාගැනීමට අවශ්‍ය පරිසාධක සුදුසුකම් කඩිනමින් සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 සැප්තැම්බර් 01 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ අනුකාරක සභාව විසින් නිර්දේශ කළ පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණි. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව පවත්වා ගෙන යනු ලබන ආයතනවලට එරෙහිව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේම නඩු පැවරීම | ආයතන ලියාපදිංචි කිරීමෙන් බලාපොරොත්තුවන නියාමන කාර්යය ඉටුකළ හැකි පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය නෛතික පරිසරය සකසා |

| | | | |
|---|---|---|---|
| | | සඳහා ප්‍රතිපාදන ඇතුලත් කිරීමට උපදෙස් ලැබී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. |
| (ඉ) | කොමිෂන් සභාවේ සැලසුම් හා සංවර්ධන අංශය විසින් 2013 වර්ෂයේදී බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර තිබුණද 2023 වර්ෂය අවසන් වන විටත් සැලැස්ම සකස් කිරීමට අපොහොසත් වී තිබුණි. | 2023 වර්ෂයේ පළමු කාර්තුවේ බස්නාහිර පළාත් වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්ම සකස්කිරීම ආරම්භ කරන ලද අතර ආරම්භ කරන ලද දත්ත එක්රැස් කිරීම 2023 අවසන් කාර්තුවේදී අවසන් කරන ලද බව. | බස්නාහිර පළාත සඳහා වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඊ) | නිපුණතා සම්මත සකස් කර ගැනීම සඳහා බාහිර ආයතන විසින් තැන්පත් කරන ලද ආපසු ගෙවිය යුතු කෙටි කාලීන ප්‍රදාන රු.5,155,322 ක් වූ අතර ඒ තුළ තැන්පත් කර වසර 5 ඉක්ම වූ රු.1,426,918 ක් පැවතුණු අතර මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර 05 ඉක්මවා ආපසු ගෙවිය යුතු ගිණුමෙහි ඇති රු.1,426,918 ක මුදල 2024 වර්ෂයේදී පෙර වර්ෂ ගැලපුම් ගිණුම මඟින් ආදායමක් ලෙස සළකා ගිණුම්ගත කරන බව. | ආපසු ගෙවිය යුතු කෙටි කාලීන ප්‍රදාන නිරවුල් නොවීමට හේතු සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 මාර්තු වන විට කොමිෂන් සභාවේ ලියාපදිංචි වී තිබුණු ආයතන අතරින් ලියාපදිංචිය කල්ඉකුත් වී වසර 20 කට වැඩි ආයතන 16 ක් ද වසර 05 ත් වසර 20 ත් අතර කාලයක් ගතවී තිබුණු ආයතන 486 ක් සම්බන්ධයෙන් කොමිෂන් සභා පනතේ 14 (1), 15 (1) උප වගන්ති හා 10(3)(අ) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය අලුත් කර ගැනීම සඳහා ඉල්ලීම් කර නොතිබුණි. තවද එම ආයතන නැවත ලියාපදිංචිය අලුත් නොකර වෘත්තීය පුහුණු කටයුතු පවත්වාගෙන යනු ලබන බවට පරීක්ෂා කිරීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම 2016 වසරේ සිට 2022 දක්වා ආයතන 36 ක් ලියාපදිංචිය අලුත්කර ගැනීම සඳහා ඉල්ලීම්කර තිබුණ ද 2024 මාර්තු 31දින වන විට ද එම ආයතනවල ලියාපදිංචිය අලුත්කර නොතිබුණි. | වසාදමා ඇති ආයතන සියල්ලම මහජනතාවට දැනගැනීම සඳහා “close” ලෙස සඳහන් කර කොමිෂන් සභා වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කර ඇත. ලියාපදිංචිය අලුත් කිරීමට ඉල්ලුම් කර තිබුණද අවශ්‍ය නිර්ණායක සපුරා නොමැති ආයතන වෙත අඩුපාඩු සම්පූර්ණ කර නැවත ඇගයීම සඳහා අයදුම්කරන ලෙස දන්වා ඇතිබව. | ලියාපදිංචිය කල් ඉකුත්වූ ආයතනයන්හි ලියාපදිංචිය අලුත් කිරීම හෝ ලියාපදිංචිය අහෝසි කිරීමට හෝ කටයුතු කල යුතු අතර ලියාපදිංචිය අලුත් කිරීම නොකල ආයතන සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගැනීමට හැකිවන පරිදි නීති සකසා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොමිෂන් සභාව විසින් පාඨමාලා පැවැත්වීම තාවකාලිකව තහනම් කරන ලද ආයතන කොමිෂන් සභාවේ නියෝග නොසලකා හරිමින් සාමාන්‍යය පරිදි තම ඉගැන්වීම් කටයුතු සිදු කරමින් පැවතුණි. | තාවකාලිකව ලියාපදිංචිය අත්හිටුවා ඇති ආයතන වෙත අවවාදාත්මක ලිපි යවා ඇති අතර,එසේ නොමැති ආයතනවල ලියපාදිංචිය අවලංගු කිරීමට කටයුතු කරමින් පවතින බව. | නියාමන ආයතනයකින් ඉටුවිය යුතු කාර්යයන් ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |